// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2432/08 – 2025 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා – 2025.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2017/97.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.09.28 දිනැති හා අංක 2299/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.09.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 153, ට්‍රිලියම් රෙසිඩන්සීස්, ගොල්ෆ් වින්ග්, අංක 8-5/4 හි පදිංචි ජේ. කේ. ද සිල්වා මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, නැගෙනහිර කුළුණ, 03 වන මහල හි පිහිටි එතිහැඩ් එයාවේස් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 54/2022 හා 2025.03.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අප්‍රේල් මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 044205 – 11 (2025/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව - කොළඹ**

ජේ. කේ. ද සිල්වා මයා
අංක 8-5/4,
ගොල්ෆ් වින්ග්,
ට්‍රිලියම් රෙසිඩන්සීස්,
අංක 153,
ඇල්විටිගල මාවත,
කොළඹ 08.

නඩු අංකය - A/54/2022

*පළමු පාර්ශ්වය*

මගේ අංකය - IR/COM/02/2017/97

එතිහැඩ් එයාවේස්
03 වන මහල,
නැගෙනහිර කුළුණ,
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ආර්. නවෝදයම් වන මා පත්කොට, මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වශයෙන් පෙන්වා සිට ඇත්තේ -

“2016.11.08 වැනි දින සිට 2017.07.03 දින දක්වා සේවයට වාර්තා කිරීමට ඉඩ නොදී දීමනා රහිතව වැටුප පමණක් ලබාදෙමින් 2017.07.03 දින සිට ජේ. කේ. ද සිල්වා මහතාගේ සේවය අවසන් කිරීම නිසා ඔහුට කිසියම් අසාධාරණයක් සිදුව තිබේද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහු වෙත ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.”

**ප්‍රදානය**

මෙම නඩුව මුල් වරට 2022.10.19 දින කැඳවූ අවස්ථාවේදී පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරු වන ජෝසප් ද සිල්වා මහතා පෙනී සිට ඇති අතර දෙවන පාර්ශ්වය වන වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ එච්. චන්ද්‍රකුමාර් ද සිල්වා මහතා ද පෙනී සිට තම තමන්ගේ ස්ථාවරය පිළිබඳව කරුණු දක්වන ලදී.

ඒ අනුව මෙම කාරණයට අදාළව බලපාන්නාවූ A/53/2017, A/64/2019, A/116/2019 සහ A/30/2021 වශයෙන් නඩු ගොනු පහක් සහ මෙම ආරාවුලට එක එල්ලේම අදාළවන අංක A/54/2022 දරන නඩු ගොනුවක් ද පවත්නා බව අනාවරණය විය. මෙකී ආරාවුලට අදාළ බොරැල්ලේ කම්කරු විනිශ්චය සභාවේ අංක LT/8/188/17 දරන නඩු කෘත්‍යයක් පවරා එම නඩුවේ නියෝගයට විරුද්ධව කොළඹ මහාධිකරණයේ අංක HCALT/104/2018 යටතේ අභියාචනයක් පවරන ලදුව මහාධිකරණයේ දුන් තීන්දුවට විරුද්ධව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC/Appeal/65/2021 යටතේ පවරන ලද අභියාචනය ඒ අවස්ථාව වන විට ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින්

විවාදයට නියම කොට තිබුණ බවත් ඒ අනුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ප්‍රකාශයට පත්කරන තෙක් බේරුම්කරණයේ මෙම නඩුව විභාගයට ගැනීම සුදුසු නොවන බවත් දෙපාර්ශ්වයේම මතය වූ හෙයින් ගරු බේරුම්කරණය විසින් දෙසැම්බර් 08 දින දක්වා කල් තබන ලදී.

ඉන් පසුව මෙම නඩුව 2022.12.08, 2023.02.16, 2023.04.27, 2023.08.08, 2023.09.26 සහ 2023.12.08 යන දිනවල කැඳවා අවසාන වශයෙන් 2024.02.26 දින කැඳවන ලදුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2023.11.09 දින ප්‍රකාශයට පත්කරන ලද අවසන් තීන්දුවේ සහතික පිටපතක් පාර්ශ්වකරුවන් විසින් මෙම නඩුවට ගොනු කරන ලදී.

එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ තීන්දුව පරිදි මෙම A/54/2022 දරන ආරාවුලේ නඩු කටයුතු අවසන් කරමි.

ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ එම තීන්දුව ප්‍රකාර කටයුතු කිරීමට දෙපාර්ශ්වය බැඳී සිටී.

නීතිඥ **ආර්. නවෝදයම්,**
බේරුම්කරු.

2025 මාර්තු මස 05 වැනි දින.

EOG 04 – 0114